# අපේ පාසල කොතරම් ගුණාත්මක ද?

පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් මාර්ගෝපදේශය

කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

# ඇගයීමක් යනු (Evaluation)

- සංවිධානයක හෝ යම් කාර්යාවලියක සඵලතාව ඉහළ නැංවීමේදී එහි ශක්තීන් සහ දුබලතා තක්සේරු කිරීම සඳහා අවශ්‍යවන දත්ත රැස්කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේදය ඇගයීමකි.

- යමක් නිවැරදිව සිදුකරයි ද යන්න පිළිබඳ සොයා බැලීමකි.

- ඇගයීම යනු වැඩසටහනක් විවේචනාත්මකව විභාග කිරීමේ ක්‍රමවේදයකි. වැඩසටහනේ ක්‍රියාකාරීත්වය, ලක්ෂණ හා ප්‍රතිඵල සම්බන්ධව තොරතුරු රැස්කිරීම හා විශ්ලේෂණ මීට අදාළ වේ. වැඩසටහනේ සඵලතාව වැඩි දියුණු කිරීම සඳහා එම වැඩසටහන විනිශ්චය කිරීම මෙහිදී අපේක්ෂිතයි.

# නව මාර්ගෝපදේශයේ අන්තර්ගතය

ඇගයීම් ක්ෂේත්‍ර

↓

ප්‍රමිති

↓

ප්‍රමිතියට ළඟා වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා

↓

නිර්ණායක

↓

දර්ශක

↓

ලකුණු පිරිනැමීම

↓

ගුණාත්මක තහවුරුව සම්බන්ධ ප්‍රශ්න

↓

චක්‍රලේඛය හා ඇමුණුම්

# ඇගයීම් ක්ෂේත්‍ර

1. ශිෂ්‍ය සාධනය
2. ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම
3. විධිමත් විෂයමාලා කළමනාකරණය
4. විෂය සමගාමී කටයුතු
5. ශිෂ්‍ය සුභසාධනය
6. නායකත්වය සහ කළමනාකරණය
7. භෞතික සම්පත් කළමනාකරණය
8. පාසල හා ප්‍රජාව

# ප්‍රමිතියක් යනු කුමක්ද

- ප්‍රශස්ත යැයි පිළිගත් මට්ටමකි
- උසස්යැයි සම්මත රටාවක් හෝ ආකෘතියකි
- පරිසාධන මට්ටමකි
- අපේක්ෂිත ලක්ෂයකට පැමිණීමකි

# ප්‍රමිතියට ළඟා වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා

- යම්කිසි කාර්යයක් සඳහා පවතින මට්ටමේ සිට අපේක්ෂිත මට්ටම දක්වා ළඟාවීමට සම්පූර්ණ කළ යුතු තත්වයන්

**ප්‍රමිතිය**

උදා - ශිෂ්‍යයාගේ සමබර පෞරුෂය, විභව්‍යතා, අන්‍යෝන්‍ය සහයෝගීතාව, සාරධර්ම හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කළ හැකි වන පරිදි විෂය සමගාමී ක්‍රියාකාරකම් සිදු කිරීම

**අවශ්‍යතා**

- විෂය සමගාමි කටයුතු මනාව සැලසුම් කර ක්‍රියාත්මක කරයි.
- විවිධ වැඩසටහන් තුළින් ශිෂ්‍ය විභ්‍යවතා සහ නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරයි.
- විෂය සමගාමි කටයුතු මගින් ශිෂ්‍යයින් තුළ ආචාර ධර්ම හා සාරධර්ම වර්ධනය කරයි.

# නිර්ණායක (Criteria)

- යමක් නිශ්චය කිරීම සඳහා හෝ තෝරා ගැනීම සඳහා භාවිත කළ හැකි ක්‍රමයකි.

- තීරණයක් ගැනීමට හෝ විනිශ්චයකට පැමිණීමට අදාළවන යමක පවතින ප්‍රමිතියකි

# දර්ශක (Indicator)

- ඕනෑම අංගයක / පද්ධතියක තත්ත්වය කොතරම් ද, කෙබඳු ද, කුමන ආකාරයද යන්න ප්‍රමාණාත්මක ව පෙන්වන මිනුම් දණ්ඩකි.

# සාරාංශය

| අනු අංක | ඇගයීම් ක්ෂේත්‍ර | ප්‍රමිති | ප්‍රමිතියට ළඟා වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා | නිර්ණායක | දර්ශක | ගුණාත්මක ප්‍රශ්න |
|---|---|---|---|---|---|---|
| 1 | ශිෂ්‍ය සාධනය | 02 | 03 | 05 | 35 | 05 |
| 2 | ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම | 02 | 05 | 04 | 30 | 07 |
| 3 | විධිමත් විෂයමාලා කළමනාකරණය | 01 | 03 | 08 | 25 | 05 |
| 4 | විෂය සමගාමී කටයුතු | 01 | 03 | 05 | 14 | 04 |
| 5 | ශිෂ්‍ය සුබසාධනය | 01 | 04 | 09 | 22 | 04 |
| 6 | නායකත්වය හා කළමනාකරණය | 01 | 07 | 16 | 45 | 07 |
| 7 | භෞතික සම්පත් කළමනාකරණය | 01 | 02 | 08 | 26 | 04 |
| 8 | පාසල හා ප්‍රජා සම්බන්ධතා | 01 | 03 | 05 | 13 | 04 |
| | මුළු ගණන | 10 | 30 | 60 | 210 | 40 |

# ලකුණු ලබා දීම

එක් එක් දර්ශකයට අදාලව පවතින තත්ත්වය සලකා බලා පහත සඳහන් පරිමාණවලට අනුව ලකුණු ලබා දිය යුතුය.

(ලබා දෙන ලකුණ, ලකුණු තීරුවේ ඉලක්කමෙන් සඳහන් කරන්න)

- ✓ ලකුණු 06 - විශිෂ්ටයි
- ✓ ලකුණු 05 - ඉතා හොඳයි
- ✓ ලකුණු 04 - හොඳයි
- ✓ ලකුණු 03 - සාමාන්‍යයි
- ✓ ලකුණු 02 - සංවර්ධනය විය යුතුයි
- ✓ ලකුණු 01 - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි

ලකුණු ප්‍රමාණය තීරණය කළ යුත්තේ අදාළ නිර්ණායක දක්වන කරුණු නිවැරදි ව ඉටු වී තිබේ ද යන්න පිළිබඳ විමසා බැලීමෙන් පසුවයි.

# දර්ශකවලට ලකුණු ලබා දීමේ දී අනුගමනය කළ යුතු පොදු කරුණු

- ඇගයීම් කරන ඒ ඒ නිර්ණායකයට අදාල මුළු ලකුණු ද සඳහන් කළ යුතුය.

- ඇගයීම් ක්ෂේත්‍රය සඳහා ලකුණු ගණනය කිරීමේ දී, ඇගයීමට ලක් කරන ලද දර්ශක සංඛ්‍යාවට ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාවෙන් ලබා ගෙන ඇති ලකුණු සංඛ්‍යාව අනුව ප්‍රතිශතය ගණනය කළ යුතුය.

# එක් එක් ඇගයීම් ක්ෂේත්‍ර සඳහා ලකුණු ලබා දීම

$$\frac{\text{ලබාගත් ලකුණු සංඛ්‍යාව}}{\text{ඇගයීම් කළ දර්ශකවලට අදාළ ව ලබා ගත හැකි ලකුණු සංඛ්‍යාව}} \times 100$$

උදා- නායකත්වය හා කළමනාකරණය ක්ෂේත්‍රය ඇගයීමේ දී පාසලක් දර්ශක 45 සඳහා ලකුණු 120 ක් ලබා ගෙන ඇත. ලකුණු ප්‍රතිශතය ගණනය කරන්න.

$$\frac{120}{45\times6}\times 100$$

ලකුණු ප්‍රතිශතය = 44%

# චක්‍රලේඛය හා ඇමුණුම්

- පාසල් ඇගයීම් ක්‍රියාවලියේ දී යොදා ගත් අංක 06/2008 දරණ චක්‍රලේඛය අවලංගු කෙරේ.

- අංක 31/2014 දරණ 2014.12.02 දිනැති චක්‍රලේඛය අදාල වේ.

- මෙම ඇගයීම් ක්‍රියාවලිය 2015 වසරේ සිට ක්‍රියාත්මකයි.

- **“පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සදහා වූ ඇගයීම් මාර්ගෝපදේශය”** අභ්‍යන්තර හා බාහිර ඇගයීම් සඳහා භාවිත කළ යුතුය.

- **31/2014 චක්‍රලේඛය හඳුන්වා දීම**

CIRCULAR

# ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ විස්තර කිරීම

# ශිෂ්‍ය සාධනය ඇගයීමේ වැදගත්කම

- නිපුණතා අත්පත් කර ගැනීම මැනීම සඳහා
- පාසලේ විෂයමාලා ඉගැන්වීමේ තත්වය අවබෝධ කර ගැනීම
- විශ්ලේෂණ කාර්යයන් සඳහා
- ප්‍රතිපෝෂණ හා ප්‍රතිකාර්යන් සඳහා
- ගුරු කාර්යසාධනය මැනීම සඳහා
- සමස්ත පාසලේ සාධන මට්ටම තහවුරු කර ගැනීම

# ශිෂ්‍ය සාධනයේ ප්‍රමිති, අවශ්‍යතා හා නිර්ණායක

| | | |
|---|---|---|
| ප්‍රමිති | - | 2 |
| අවශ්‍යතා | - | 3 |
| නිර්ණායක | - | 2 (ප්‍රාථමික) |
| | | 3 (ද්විතියික) |

# ශිෂ්‍ය සාධනය

## ප්‍රාථමික අංශය

- අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුනතා
- 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී ලකුණු 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය

## ද්විතියික අංශය

- ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල
- වාර පරීක්ෂණ ලකුණු
- පාසල පදනම් කරගත් ඇගයීම්

# ද්විතියික අංශය

- ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල

අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබීමේ ප්‍රතිශතය

අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමේ ප්‍රතිශතය

# ද්විතියික අංශය

- වාර පරීක්ෂණ ලකුණු

| පෙර ඇගයීම් ක්‍රමවේදය | නව ඇගයීම් ක්‍රමවේදය |
|---|---|
| ලකුණු 40 ට අඩුවෙන් ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව (ශ්‍රේණි පදනමින්) | ලකුණු 40 ට වැඩියෙන් ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (විෂය පදනමින්) |

- පාසල පදනම් කරගත් ඇගයීම්

| පෙර ඇගයීම් ක්‍රමවේදය | නව ඇගයීම් ක්‍රමවේදය |
|---|---|
| එක් එක් විෂයයන්වල වාරය සඳහා ඇගයීම් නිම කළ පන්ති සංඛ්‍යාව | එක් එක් ශ්‍රේණි කාණ්ඩයේ සියලුම විෂයන්වලට අදාළව ඇගයීම් නිම කළ පන්ති ප්‍රතිශතය |

# සාධනය ලකුණු පරිමාණය

ඒ ඒ මට්ටමට ලඟා වූ ශිෂ්‍ය ප්‍රතිශතය / පංති ප්‍රතිශතය අනුව ලකුණු ලබා දෙන්න.

(ලබා දෙන ලකුණ, ලකුණු තීරුවේ ඉලක්කමෙන් සඳහන් කරන්න)

- ශිෂ්‍ය ප්‍රතිශතය **90%** හා ඊට ඉහළ - විශිෂ්ටයි (ලකුණු06)
- ශිෂ්‍ය ප්‍රතිශතය **75% -89%** - ඉතා හොඳයි (ලකුණු05)
- ශිෂ්‍ය ප්‍රතිශතය **60% -74%** - හොඳයි (ලකුණු04)
- ශිෂ්‍ය ප්‍රතිශතය **45% -59%** - සාමාන්‍යයයි (ලකුණු03)
- ශිෂ්‍ය ප්‍රතිශතය **25% -44%** - සංවර්ධනය විය යුතුයි (ලකුණු02)
- ශිෂ්‍ය ප්‍රතිශතය **25%** ටඅඩු - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි. (ලකුණු01)


| වාර පරීක්ෂණ සාධනය | විෂය | ලකුණු 40 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | | සාමානය ප්‍රතිශතය | | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 6 | 7 | 8 | 9 | 10 | 11 | | | |
| 2.2.1 | මව්බස | | | | | | | | | |
| 2.2.2 | ගණිතය | | | | | | | | | |
| 2.2.3 | විද්‍යාව | | | | | | | | | |
| 2.2.4 | ඉංග්‍රීසි | | | | | | | | | |
| 2.2.5 | ඉතිහාසය | | | | | | | | | |
| 2.2.6 | ආගම | | | | | | | | | |
| 2.2.7 | 6-9 ශ්‍රේණිවල අනෙකුත් විෂයයන් | | | | | | | සාමාන්‍ය ප්‍රතිශතය | මධ්‍ය ප්‍රතිශතය | |
| | භූගෝල විද්‍යාව | | | | | | | | | |
| | ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | | | | | | | | | |
| | දෙවන බස (සිංහල/ දෙමළ) | | | | | | | | | |
| | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යයනය | | | | | | | | | |
| | ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | | | | | | | | | |
| 2.2.8 | සෞන්දර්යය විෂයයන් | | | | | | | | | |
| | චිත්‍ර | | | | | | | | | |
| | නැටුම් | | | | | | | | | |
| | සංගීතය | | | | | | | | | |
| | නාට්‍ය හා රංග කලාව | | | | | | | | | |
| 2.2.9 | පළමු කාණ්ඩ විෂයයන් | | | | | | | | | |
| 2.2.10 | තෙවන කාණ්ඩ විෂයයන් | | | | | | | | | |

| වාර පරීක්ෂණ සාධනය | විෂය | ලකුණු 40 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | | සාමාන්‍ය ප්‍රතිශතය | | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 6 | 7 | 8 | 9 | 10 | 11 | | | |
| 2.2.1 | මව්බස | 75 | 78 | 73 | 63 | 75 | 70 | 72 | | 4 |
| 2.2.2 | ගණිතය | 50 | 52 | 60 | 40 | 45 | 62 | 52 | | 3 |
| 2.2.3 | විද්‍යාව | 62 | 64 | 55 | 42 | 70 | 65 | 60 | | 4 |
| 2.2.4 | ඉංග්‍රීසි | 40 | 43 | 35 | 37 | 75 | 53 | 47 | | 3 |
| 2.2.5 | ඉතිහාසය | 50 | 52 | 40 | 42 | 80 | 67 | 55 | | 3 |
| 2.2.6 | ආගම | 71 | 73 | 65 | 60 | 82 | 73 | 71 | | 4 |
| 2.2.7 | 6-9 ශ්‍රේණිවල අනෙකුත් විෂයයන් | | | | | | | සාමාන්‍ය ප්‍රතිශතය | මධ්‍ය ප්‍රතිශතය | |
| | භූගෝල විද්‍යාව | 75 | 72 | 60 | 55 | | | 66 | | |
| | ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | 80 | 85 | 70 | 67 | | | 76 | 64 | 4 |
| | දෙවන බස (සිංහල/ දෙමළ) | 25 | 35 | 32 | 40 | | | 33 | | |
| | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යයනය | 70 | 75 | 67 | 68 | | | 70 | | |
| | ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | 75 | 72 | 68 | 85 | | | 75 | | |
| 2.2.8 | සෞන්දර්යය විෂයයන් | 68 | 70 | 57 | 82 | 78 | 65 | 70 | | |
| | චිත්‍ර | 62 | 64 | 55 | 42 | 70 | 65 | 60 | | |
| | නැටුම් | 50 | 52 | 40 | 42 | 80 | 67 | 55 | 65 | 4 |
| | සංගීතය | 75 | 55 | 85 | 68 | 58 | 76 | 70 | | |
| | නාට්‍ය හා රංග කලාව | 69 | 80 | 78 | 76 | 59 | 68 | 72 | | |
| 2.2.9 | පළමු කාණ්ඩ විෂයයන් | | | | | | | | | |
| 2.2.10 | තෙවන කාණ්ඩ විෂයයන් | | | | | | | | | |

## ප්‍රධාන/හර විෂයයන් සඳහා සාමාන්‍ය ප්‍රතිශතය අනුව ලකුණු පිරිනැමේ.

පාසලක 6-11 දක්වා ශ්‍රේණිවල සමාන්තර පංති 2 බැගින් ඇත. මධ්‍ය වාර්ෂික පරීක්ෂණයේ දී උක්ත ශ්‍රේණිවල සිසුන් ගණිතය විෂය සඳහා ලබාගත් ලකුණු අනුව ලකුණු 40ට වඩා ලබාගත් සිසුන් සංඛ්‍යා අනුව ලකුණු ප්‍රතිශත හා ඇගයීම් ලකුණු

| | 6 | 7 | 8 | 9 | 10 | 11 | | ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|
| මුළු සිසුන් | 76 | 72 | 81 | 78 | 80 | 69 | 456 | |
| ලකුණු 40ට වැඩි සිසුන් | 56 | 54 | 50 | 48 | 67 | 50 | 325 | |
| ලකුණු 40ට වැඩි ප්‍රතිශතය | 74 | 75 | 62 | 62 | 84 | 72 | 71 | 4 |



## හර විෂයයන් නොවන අනෙකුත් විෂයයන් සඳහා මධ්‍ය ප්‍රතිශතය අනුව ලකුණු පිරිනැමේ.

පාසලක **6-9** දක්වා ශ්‍රේණිවල සමාන්තර පංති **3** බැගින් ඇත. මධ්‍ය වාර්ෂික පරීක්ෂණයේ දී උක්ත ශ්‍රේණිවල සිසුන් හර විෂයයන් හැර අනෙකුත් විෂයයන් සඳහා ලබාගත් ලකුණු අනුව ලකුණු **40**ට වඩා ලබාගත් සිසුන් ප්‍රතිශත අනුව හිමිවිය යුතු ලකුණු

| | 6 | 7 | 8 | 9 | සාමාන්‍ය ප්‍රතිශතය | මධ්‍ය ප්‍රතිශතය | ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| භූගෝල විද්‍යාව | 76% | 72% | 81% | 78% | 76% | 68% | 4 |
| ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | 56% | 54% | 50% | 48% | 54% | | |
| දෙවන බස - දෙමළ | 74% | 75% | 62% | 62% | 72% | | |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන | 48% | 54% | 62% | 51% | 54% | | |
| ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | 80% | 78% | 84% | 88% | 82% | | |

## උසස් පෙළ විෂය ධාරා සඳහා ලකුණු ලබා දීමේදී අදාළ විෂය ධාරාවේ සියලුම විෂයයන්ට ලකුණු 40ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය සැලකේ.

කලා විෂය ධාරාවට අයත් සිසුන්ගේ මධ්‍ය වාර පරීක්ෂණය සඳහා සිසුන් හදාරණ සියලු විෂයයන්ට ලකුණු 40 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශත පහත පරිදි වේ.

12 ශ්‍රේණිය - 70%

13 ශ්‍රේණිය - 72%

සාමාන්‍ය ප්‍රතිශතය - 71% → ලකුණු 4

පාසල් පාදක ඇගයීම් සඳහා ලකුණු ලබා දීමේදී අදාළ ශ්‍රේණි කාණ්ඩයේ පසුගිය වාරයට අදාළ **ඇගයීම් සම්පූර්ණයෙන්ම නිම කර ඇති පන්ති ප්‍රතිශතය** සැලකේ.

| | | |
|---|---|---|
| 6-9 මුළු පන්ති ගණන | → | 12 |
| වාරයට අදාළ ව සියලුම විෂයයන් සඳහා ඇගයීම් සම්පූර්ණ කළ 6-9 මුළු පන්ති ගණන | → | 9 |
| වාරයට අදාළ ඇගයීම් සම්පූර්ණ කළ 6-9 පන්ති ප්‍රතිශතය | → | $\frac{9 \times 100\%}{12}$ =75% |
| 6-9 ශ්‍රේණි ඇගයීම් සඳහා ලැබෙන ලකුණ | → | 5 |

පාසල් පාදක ඇගයීම් සඳහා ලකුණු ලබා දෙනු ලබන්නේ සියලුම විෂයන් සඳහා ඇගයීම් සම්පූර්ණයෙන්ම නිම කර ඇත්නම් පමණි

# පාසල පදනම් කරගත් ඇගයීම් වැඩසටහනට අනුව සාධන මට්ටම විශ්ලේෂණය කිරීම හා වාර්තා තබාගැනීම 6-13

- වාර්ෂික SBA සඳහා සැලැස්මක් සකස් කර තිබීම
- SBA සැලසුම් සකස් කිරීම
- අනුමත කර තිබීම
- නියාමනය කර තිබීම

# වාර විභාග අනුව සාධන මට්ටම විශ්ලේෂණය කිරීම හා වාර්තා තබාගැනීම 6-13

- ලකුණු වාර්තා පාසලේ සහ ගුරුවරුන් සතුව තබාගැනීම
- විශ්ලේෂණය කර තිබීම
- ව්‍යාපෘති සකස් කර තිබීම
- ප්‍රතිපෝෂණ හා ප්‍රතිකාර්ය වැඩසටහන් සැලසුම් කිරීම, අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය හා ප්‍රගති වාර්තා ලබා දී තිබීම

# ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම

- මෙම ඇගයීම මඟින් පංති කාමරයේ සාමාන්‍ය ඉගැන්වීම් කටයුතු නිරීක්ෂණයට එහා ගිය ගුරුවරයා පිළිබඳ ව මනා සොයා බැලීමක් සිදුකිරීම අපේක්ෂිතයි.
- එක් ඇගයීම් පත්‍රිකාවක් ගුරුවරු 4 ක් ඇගයීම සඳහා භාවිත කළ හැකිය.
- එකම විෂයයක් උගන්වන ගුරුවරුන් එකම ඇගයීම පත්‍රිකාවක් යොදා ගනිමින් ඇගයීම වඩාත් උචිත වේ.
- ගුරුවරයා විසින් යොදා ගන්නා ඕනෑම ඉගැන්වීම් ක්‍රමයක් ඇගයීම සඳහා අදාල පත්‍රිකාව භාවිත කළ හැකි වේ.

# ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම

- 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා එකම ඇගයීම් ආකෘතියක් භාවිත කිරීමට හැකිය.

- ලකුණු 6 පරිමාණය  භාවිත කර ඇත.

- එකම දර්ශකයක් වත් ඉවත් කළ නොහැක.

- අදාළ ගුරුවරයා අභ්‍යන්තර ඇගයීමට ලක් වී ඇත්දැයි පරීක්ෂාවට ලක් කළ යුතු ය.

# ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම ක්ෂේත්‍රයේ අන්තර්ගතය

පාඩම සැලසුම් කිරීම, පිවිසීම - දර්ශක 9

පාඩම සංවර්ධනය - දර්ශක 9

ඇගයීම - දර්ශක 4

පුද්ගල වගකීම, පෞරුෂය දර්ශක 8

# ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම

- ඇගයීම් පත්‍රිකාවේ 2.1, 2.2 හා 2.3 නිර්ණායක ගුරුවරයාගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඇගයීම සඳහාත් 2.4 නිර්ණායකය ගුරුවරයා වෙතින් පිළිබිඹු විය යුතු පුද්ගල වගකීම් හා පෞරුෂය ඇගයීම සඳහාත් අදාල වේ.

- ඇගයීම් කරන ගුරුවරයා පිළිබඳ ව විදුහල්පති, කළමනාකරණ මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීම, ගුරුවරයාගේ කාර්යයට අදාල ලිපිගොනු / ලේඛන පරීක්ෂා කිරීම හා ගුරුවරයාගේ චර්යාව පිළිබඳ නිරීක්ෂණ පුද්ගල වගකීම් හා පෞරුෂය නිර්ණායකයේ දර්ශකවලට ලකුණු දීමේ දී සළකා බැලිය යුතු වේ.

# ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම ක්ෂේත්‍රය සඳහා ලකුණු පිරිනැමීම

ගුරුවරයා ලබාගත් ලකුණුවල ප්‍රතිශතය =

$$\frac{\text{ගුරුවරයා ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව}}{\text{ඇගයීම් කළ දර්ශකවලට අදාළ ව ලබා ගත හැකි ලකුණු සංඛ්‍යාව}} \times 100$$

**A** නම් ගුරුවරයා දර්ශක **30** සඳහා ලකුණු **122**ක් ලබා ගත් විට ඔහුගේ ලකුණු

$$\frac{122}{180\ (30 \text{X} 6)} \text{ X } 100 = 67.7$$

# ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම ක්ෂේත්‍රය සඳහා ලකුණු පිරිනැමීම

## ඉගෙනුම් ඉගැන්වීම් ඇගයීමෙන් ලබාගත් ලකුණුවල ප්‍රතිශතය ගණනය කිරීම

**ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම සඳහා පාසල ලබා ගත් ලකුණු ප්‍රතිශතය =**

$$\frac{\text{පාසලේ ගුරුවරුන් ඇගයීමෙන් ලබා ගත් ලකුණු ප්‍රතිශතයන් හි එකතුව}}{\text{ඇගයීමට ලක් කළ මුළු ගුරු සංඛ්‍යාව}}$$

# උදාහරණයක්

- ගුරුවරුන් 06 දෙනෙකු ඇගයීමට ලක් වූ විට පහත සදහන් පරිදි ගණනය කළ යුතුය

| ගුරුවරයාගේ නම | එක් එක් ගුරුවරයා ලබාගත් ලකුණු ප්‍රතිශතය |
|---|---|
| A | 63% |
| B | 54% |
| C | 59% |
| D | 46% |
| E | 60% |
| F | 67% |
| Total | 349 |

**ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම ක්ෂේත්‍රය සඳහා පාසල ලබා ගත් ලකුණු = 349/6 =54%**

# නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිය යුතු කරුණු

| | |
|---|---|
| සැලසුම් | අවුරුදු 5ක කාල සීමාවක් සඳහා සියලුම අංශ ආවරණය වන පරිදි පස් අවුරුදු සැලැස්ම සකස් කිරීම. ඉන්පසු වසරින් වසර පස් අවුරුදු සැලැස්ම යාවත්කාලීන වෙමින් ඉදිරියට ගෙන යාම. |
| මූල්‍ය කටයුතු | පාසල් සංවර්ධන ගිණුම - දැනට අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛ අංක 07/2013 අනුව පාසල් සංවර්ධන ගිණුමට අදාළ ලේඛන පවත්වා ගෙන යාම .<br><br>පහසුකම් හා සේවා ගාස්තු ගිණුම - උප පත්‍රිකා ලේඛනය,රිසිට් හා මුදල් පොත, අනුමත වාර්ෂික ඇස්තමේන්තුව, සිව් මස් ගිණුම් වාර්තා, ලදුපත් හා වවුචර් ගොනු පහසුකම් හා සේවා ගාස්තු ගිණුම සම්බන්ධ පොදු ලේඛන නඩත්තු කළ යුතු අතර ඉහත සියළු ලේඛන සහ ලිපිගොනු පරීක්ෂා කර ලකුණු පිරිනැමිය යුතුය.<br><br>අනෙකුත් සියලු ගිණුම සම්බන්ධව ඒ ඒ ගිණුම් වලට අදාළ සෑම ලේඛනයක්ම නඩත්තු කළ යුතු අතර එම ලේඛන සහ ලිපිගොනු පරීක්ෂා කර ලකුණු පිරිනැමිය යුතුය. |
| ලිපිගොනු නඩත්තුව | ලිපිගොනු නඩත්තු කිරීමේදී කාර්යාල ක්‍රමවේද අනුව ක්‍රමානුකූලව තබා ගැනීම ( සටහන් පත්‍ර භාවිතය, ලිපි/සටහන් අංකනය , නිවැරදිව ඇමිණීම............. ) සහ පහසුවෙන් හඳුනා ගැනීම සඳහා වර්ණ භාවිතය වැනි විවිධ නිර්මාණාත්මක ක්‍රමවේද භාවිත කිරීම.<br><br>අනවශ්‍ය ලිපිගොනු ඉවත් කිරීමේදී අදාළ ක්‍රියාපටිපාටි අනුගමනය කොට අවශ්‍ය අවස්ථාවන්හි දී අනුමැතිය ලබා ගැනීම කර තිබීම. |

# ගුණාත්මක ප්‍රශ්න

- අභ්‍යන්තර ඇගයීම්වලදී පමණක් භාවිතා කරන්න

- සෑම අභ්‍යන්තර ඇගයීමකින් පසුව ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ ගුණාත්මක ප්‍රශ්න පිළිබඳව ගුරු මණ්ඩලය සමග සාකච්ඡා කොට පහත සඳහන් වගුව අනුව සාරාංශ වාර්තාවක් සකස් කරන්න

| සාකච්ඡා කළ කරුණු | හඳුනාගත් සංවර්ධනය විය යුතු ක්ෂේත්‍ර/අංශ | ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග (ඇත්නම්) |
|---|---|---|
| | | |
| | | |
| | | |

- මේ සඳහා ලකුණු ලබා දීමක් අවශ්‍ය නැත

# ගුණාත්මක ප්‍රශ්න

ඇගයීමෙන් පසු පහත සඳහන් පරිදි පාසල පිළිබඳ අනාවරණ සටහන් කළ යුතු ය.

- අභ්‍යන්තර ඇගයීමෙහි අනාවරණ අනුව පාසලේ ප්‍රබලතා / ශක්තීන් ලෙස හඳුනා ගත හැකි ප්‍රධානතම කරුණු 05ක්
- අභ්‍යන්තර ඇගයීමෙහි අනාවරණ අනුව ඉදිරි වර්ෂය තුළ සංවර්ධනය විය යුතු යැයි හඳුනාගත් ප්‍රධානතම කරුණු 05ක්

- අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාත්මක කිරීමෙන් පසු පාසලේ විශේෂයෙන් ම සංවර්ධනය විය යුතු ලෙස ඉහතින් සටහන් කළ කරුණු 05 සඳහා ඊළඟ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීමේ දී ප්‍රමුඛතාව ලබා දිය යුතු වේ

# ක්‍රියාකාරකම

- කණ්ඩායම් කිහිපයකට බෙදා ඇගයීම් ක්ෂේත්‍ර යටතේ ඇති ගුණාත්මක ප්‍රශ්න පිළිබද සාකච්ඡා කොට පහත සදහන් වගුව සම්පූර්ණ කරන්න

| සාකච්ඡා කළ කරුණු | හදුනාගත් සංවර්ධනය විය යුතු ක්ෂේත්‍ර/අංශ | ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග (ඇත්නම්) |
|---|---|---|
| | | |
| | | |
| | | |

# ඇගයීම් ක්ෂේත්‍රයකට අදාලව ගොනුවක් සකස් කිරීම

ප්‍රධාන ගොනුව

ඇගයීම් ක්ෂේත්‍ර **08**
සදහා එක් ගොනුව
බැගින්

## ප්‍රධාන ගොනුවෙහි අන්තර්ගතය

- අභ්‍යන්තර ඇගයීම් සැලැස්ම
- කමිටු පත්කිරීම හා වැඩ බෙදීම
- චක්‍රලේඛ පිටපත
- අභ්‍යන්තර ඇගයීම් ලකුණු සාරාංශය හා අධ්‍යාපන ගුණාත්මක දර්ශකය සකස් කිරීම
- වාර්ෂික අධ්‍යාපන ගුණාත්මක දර්ශක පිළිබඳ වාර්තාව
- අභ්‍යන්තර ඇගයීම අනුව පාසල පිළිබඳ අනාවරණ
- පාසල් බාහිර ඇගයීම් සාරාංශ ලකුණු වාර්තාව
- වෙනත්

## ඇගයීම් ක්ෂේත්‍ර ගොනුවක අන්තර්ගතය

ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රයට අදාළ

- ඇගයීම් සැලැස්ම
- කමිටු සාමාජිකයන්
- ඇගයීම් ලකුණු
- වෙනත්

# වාර්තා තබා ගැනීම

- එක් එක් ක්ෂේත්‍රවලට අනුව වාර්තා සැකසීම වෙන් වෙන් වූ වාර්තා / ගොනු පවත්වාගැනීම
- එක් එක් ක්ෂේත්‍රවලට අනුව නියාමන සටහන් පොතක් තබා ගැනීම
- ක්ෂේත්‍රයට අදාළ යහපත් ව්‍යාවහාර වාර්තාගත කිරීම හා මතු කර පෙන්වීම

# කමිටු පත්කිරීම හා වැඩ බෙදීම

- පාසලේ ගුරු මණ්ඩලය ක්ෂේත්‍ර අනුව කමිටුවලට වෙන් කිරීම
  - ගුරු ඌනතා සහිත පාසලක නම් එක් ගුරුභවතෙකුට කමිටු කිහිපයක්
- කමිටුවේ කාර්යභාරය පැහැදිලි කිරීම (ක්ෂේත්‍රයට ඇති ප්‍රවීනතාවය අනුව)
- කමිටු සම්බන්ධීකරණය සඳහා නි.විදුහල්පති/නි.විදුහල්පති (සංවර්ධන) පත්කිරීම
- කමිටුවලට වැඩ පැවරීම / සංවර්ධන යෝජනා ලබාගැනීම
- කමිටු සාකච්ඡා හා සමාලෝචන මාසිකව පැවැත්වීම

# සමස්තය සඳහා ලකුණු ලබා දීම

- සම්බන්ධීකරණ නිලධාරී මගින් සමස්ථ ලකුණු සැකසීම
- SEQI අගය සැකසීම
- අදාළ ආයතනවලට ලබා දීම
- ක්ෂේත්‍ර ලකුණ හා SEQI අගය ප්‍රදර්ශනය කිරීම
- පසුපෝෂණ ක්‍රියාමාර්ග සැකසීම

# සමස්ත ඇගයීම

- අභ්‍යන්තර ඇගයීම සිදු කර ඒ ඒ ඇගයීම් ක්ෂේත්‍රවලට ලකුණු පිරිනමා පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය සකස් කිරීමෙන් පසු, පාසල ලබා ගත් ලකුණු අනුව ඇගයීම් ක්ෂේත්‍ර පිළිබඳ ව පහත සඳහන් පරිමාණවලට අනුව පාසල පිළිබඳ සමස්ත ඇගයීම සිදු කරන්න.

- ලකුණු 80% ට වැඩි විශිෂ්ටයි
- ලකුණු 70% - 79% ඉතාහොඳයි
- ලකුණු 60% - 69% හොඳයි
- ලකුණු 50% - 59% සාමාන්‍යයි
- ලකුණු40% - 49% සංවර්ධනය විය යුතුයි
- ලකුණු 40% අඩු - ඉතා ඉක්මනින් සංවර්ධනය විය යුතුයි

# අධ්‍යාපන ගුණාත්මක දර්ශකය සකස් කිරීම

| ඇගයීම් ක්ෂේත්‍රය | මුළු දර්ශක ගණන | මුළු දර්ශක ප්‍රමාණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | ඇගයීමට ලක් කළ දර්ශක සංඛ්‍යාව | ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | ලබාගත් ලකුණු සංඛ්‍යාව | ප්‍රතිශතය | සමස්ත ඇගයීම |
|---|---|---|---|---|---|---|---|
| ශිෂ්‍ය සාධනය | 35 | 210 (35x6) | 32 | 192 | 118 | 61% | හොඳයි |
| ඉගෙනුම ඉගැන්වීම හා ඇගයීම* | 30 | | | | | 58% | සාමාන්‍යයි. |
| විධිමත් විෂයමාලා කළමනාකරණය | 25 | 150 (25x6) | 23 | 138 | 102 | 47% | සංවර්ධනය විය යුතුයි. |
| විෂය සමගාමී කටයුතු | 14 | 84 (14x6) | 14 | 84 | 65 | 57% | සාමාන්‍යයි |
| ශිෂ්‍ය සුබසාධනය | 22 | 132 (22x6) | 20 | 120 | 80 | 60% | හොඳයි |
| නායකත්වය හා කළමනාකරණය | 45 | 270 (45x6) | 45 | 270 | 170 | 54% | සාමාන්‍යයි. |
| භෞතික සම්පත් කළමනාකරණය | 26 | 156 (26x6) | 25 | 150 | 60 | 62% | හොඳයි. |
| පාසල හා ප්‍රජා සම්බන්ධතා | 13 | 78 (13x6) | 12 | 72 | 45 | 54% | සාමාන්‍යයි |
| එකතුව | 210 | 1080 | 171 | 1026 | 640 | 453 | |
| පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය | | | | | | 56 | සාමාන්‍යයි. |